SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**9 ශ්‍රේණිය** | **පළමු වාර පරීක්ෂණය - 2019**

නම ...............................................  **ඉතිහාසය I කොටස**  **කාලය පැය දෙකයි**

**උපදෙස් :**
**සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. උඩරට රජු වූ දෙවන විමලධර්මසූරිය රජු සමඟ ............................................ නව ගිවිසුමක් ඇති කර ගත්තේය.

02. මඩිගේ මුහන්දිරම් තනතුරට ............................................ ප්‍රදේශය සඳහා හර්ජි මරික්කාර් නැමැති මුස්ලිම් ජාතිකයෙකු පත් කළේය.

03. 1818 සටනේ දී ............................................ යුධ අධිකරණය මගින් වැරදිකරුවෙකු කොට හිස ගසා දැමීය.

04. මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් යුතු ආක්‍රමණික කණ්ඩායමක් ............................................ ආණ්ඩුකාරවරයා විසින් උඩරටට යැවීය.

05. ගොංගාලේගොඩ බණ්ඩා ............................................ නමින් දඹුල්ලේ දී ඔටුනු පැළඳ වීය.

(ෆෙඩ්රික් නෝර්ත්, කලන් අල්බස්, කැප්පෙටිපොළ, ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි, වෙල්ලස්ස)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද, වරහන තුළ යොදන්න.**

06. උඩරට රජු හා ලන්දේසීන් අතර මත ගැටුම් ඇති වූ විට කඩවත් වසා දැමීම දෙපාර්ශවය අතර සබඳතා පළුදු වීමට හේතු විය. (...........)

07. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා කුණ්ඩසාලේ කුමාරයා ලෙස ප්‍රකටව සිටියේ ය. (...........)

08. බ්‍රිතාන්‍යයන් මෙරට ආරම්භ කළ ප්‍රථම ආර්ථික බෝගය කෝපි වගාවයි. (...........)

09. බ්‍රිතාන්‍යයන්ට විශාල ලෙස අලාභහානි සිදුවූයේ පහතරට වැසියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම නිසාය. (...........)

10. වීරපුරන් අප්පු විසින් 1818 නිදහස් සටනට නායකත්වය ලබා දුන්නේය. (...........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ලන්දේසි ජාතික ජොරිස් වැන් ස්පිල්බර්ජන් අද්මිරාල්වරයා ගොඩබට ස්ථානය වන්නේ මින් කුමක් ද?
    1. මඩකලපුව  2. ත්‍රිකුණාමලය  3. ගාල්ල  4. මන්නාරම

12. රාජකාරි ලිපි ලිවීමේ දී "ඔබ වහන්සේගේ සුවච කීකරු සේවක" යනුවෙන් ලිපිය අවසන් කළේ කුමන ජාතිකයන් විසින් ද?
    1. පෘතුගීසි  2. ලන්දේසි  3. ප්‍රංශ  4. ඉංග්‍රීසි

13. ජෙනරාල් ජෙරාඩ් හල්ෆට්ගේ දූත ගමන් වලදී රජුට ලබා දුන් තෑග්ගක් වන්නේ මින් කුමක් ද?
    1. පොත්පත්  2. මුද්දක්  3. සඳුන් දැව  4. පා වැසුම්

14. සාම්ප්‍රදායික දේශීය නිලධාරීන් අතර යාපන ප්‍රදේශයේ භාවිතා වූ නිල නාමයක් වන්නේ මින් කුමක් ද?
    1. කෝරාළ  2. මුදලි  3. විදානේ  4. කංකානම්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

15. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කළ අවස්ථාවේ රැකවරණය පතා බ්‍රිතාන්‍යයට පලා ගිය ඕලන්ද රජ කුමරු වන්නේ මින් කවුරුන් ද?
    1. පස්වන විලියම්   2. දෙවන විලියම්   3. ප්‍රැන්සි පර්ඩිනන්ඩ්   4. හෙන්රි


- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**
- **දේශීය කෘෂිකර්මය නංවාලීමට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු කටයුතු කළ ආකාරය අනුව පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කරන්න.**

| ආණ්ඩුකාරවරයා | කළ කාර්යය |
|---|---|
| 16. ............................................................ | වාරිකර්මාන්ත පිළිබඳ සෙවීමට 1855 කාරක සභාවක් පත් කිරීම. |
| හර්කියුලස් රොබින්සන් | 17. ............................................................ |
| 18. ............................................................ | සමුපකාර සමිති ව්‍යාපාර ආරම්භ කිරීම. |
| වෙස්ට් රිජ්වේ | 19. ............................................................ |
| 20 ............................................................ | වලවේ ගඟ හා උඩුකිරිවල ආශ්‍රිත වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය |

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. යාබද ලෝක සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
    i. අ) පෘතුගීසීන් ආසියාවෙන් ගෙන ගිය ද්‍රව්‍ය ලන්දේසීන් මිලදී ගත් වරාය A අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?
    ආ) ලන්දේසීන්ගේ මව් රට දක්වා ඇත්තේ කුමන අක්ෂරයෙන් ද?
    ඇ) පෘතුගාලයේ රජු බවට පත් වූ 2 වන පිලිප් රජුගේ මව් රට දැක්වෙන අක්ෂරය කුමක් ද?
    ඈ) ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය වන බතාවිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 04)




SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK



ii.අ) පින්තූරයේ දැක්වෙන ලාංඡනය කුමක් ද?

ආ) එම වෙළෙඳ සමාගම අයත් රට කුමක් ද?

ඇ) ආසියාවේ වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් මෙම සමාගම ලැබූ බලතල 2 ක් සඳහන් කරන්න

(ල. 04)

iii. බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් සටන් ඇසුරින් පහත වගු සටහන පුරවන්න.

| නිදහස් සටන | ආරම්භ වූ ප්‍රදේශය | නායකයින් | පැතිරී ගිය ප්‍රදේශ |
|---|---|---|---|
| 1. ............................... | ඌව වෙල්ලස්ස | 2. ............................... | හාරිස්පත්තුව |
| 1948 | 3. .......................... | 4. ............................... | තමන්කඩුව |

(ල. 04)

iv. පහත සඳහන් වන්නේ උඩරට අභ්‍යන්තර බල අරගලයේ අවස්ථා කීපයකි. ඒවා අදාළ පරිදි වගු ගත කරන්න.

A. දළදා මාලිගය අවට කම්කරු කටයුතුවලට භික්ෂූන් වහන්සේලාගේ එකඟත්වය නොගැනීම.

B. රදල බලය වර්ධනය වූ ඇතැම් පළාත් කුඩා පරිපාලන ඒකකවලට බෙදා ඒ සඳහා නව නිලධාරීන් පත්කිරීම.

C. මොල්ලිගොඩ හා ඇහැලේපොළ අතර ඇති වූ අර්බුද හේතුවෙන් උඩරට රාජ්‍යයේ දේශපාලන එක්සත් භාවය හීන වී යාම.

D. මහනුවර නගරයේ රාජකාරියට පැමිණි සබරගමුව, සතර කෝරළවල ජනතාවට රාත්‍රි කාලයේ අගනුවර නතරවීම තහනම් කර තිබීම.

| රජු හා රදල ප්‍රධානීන් අතර අරගල | රජු හා භික්ෂූන් අතර අරගල | රදලයන් රදලයන් අතර අරගල | රජු හා ජනතාව අතර අරගල |
|---|---|---|---|
| 1 ......................... | 2 ......................... | 3 ......................... | 4 ......................... |

02. i. පහත ABC ප්‍රකාශවලින් සඳහන් වන්නේ උඩරටට දූත ගමන්වල යෙදුන ලන්දේසි ජාතිකයන් හා සම්බන්ධ සිදුවීම් කීපයකි. එම සිදුවීම්වලට අදාළ ලන්දේසි දූතයන් නම් කරන්න.


A. ක්‍රි. ව. 1602 දී නැව් තුනක් සමඟ ශ්‍රී ලංකාවේ මඩකලපුවට ගොඩබට ලන්දේසි ජාතික අද්මිරාල්වරයා ...................................................................

B. I වන විමලධර්මසූරිය රජු ඉදිරියේ රජුට අගෞරව වන ලෙස කතා කළ ලන්දේසි ජාතිකයා ...................................................................

C. උඩරට ජනතාව ඉතා අලංකාර පෙරහරකින් කැඳවා ගෙන ගිය ලන්දේසි ජාතික දූතයා ...................................................................

(ල. 03)

ii. 1638 ගිවිසුමෙන් පසු ලන්දේසින් විසින් පෘතුගීසීන්ගෙන් අල්ලාගත් බලකොටු 04 ක් මෙහි සඳහන් ලංකා සිතියමේ A, B, C, D අක්ෂර වලින් දැක්වේ. ඒවා නම් කරන්න.




A. ......................................

B. ......................................

C. ......................................

D. ......................................

(ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

iii. ලන්දේසීන් මුල සිට ම II වන රාජසිංහ රජු සමඟ කපටි ලෙස කටයුතු කළ අවස්ථා 02 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල. 04)

03. i. පහත සඳහන් සිදුවීම් අතරින් උඩරට රජෙක් වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ වූ සිදුවීම් 03 ක් නම් කරන්න.

- සියම් නිකාය ආරම්භ කිරීම
- පිටිගල්කෝරළයේ කුරුඳු තැලීමට ලන්දේසින් පනවා තිබූ තහනම ඉවත් කිරීම
- ජෝන් ෆයිබස් ඉංග්‍රීසි දූතයාගේ පැමිණීම
- 1766 ගිවිසුම අත්සන් කිරීම
- පහළ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වීම (ල. 03)

ii. ලන්දේසින්ගේ පාලන කටයුතු සිදු වූ කමාන්ඩරි ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කමාන්ඩරිය | පාලනය භාරව සිටි අය | අයත් ප්‍රදේශ |
|---|---|---|
| කොළඹ | 1. .................................. | කොළඹ, කළුතර, මීගමුව |
| 2............................... | කොමදෝරු | 3. .................................... |
| 4............................... | කොමදෝරු | පුත්තලමට උතුරින් යාපනය දක්වා වෙරළබඩ තීරයත්, මඩකලපුව දක්වා වෙරළ තීරයත් අයත් විය. |

(ල. 04)

iii. පහත සඳහන් වන්නේ ලන්දේසි ආර්ථික කටයුතු කීපයකි. ඒ සම්බන්ධයෙන් ඔවුන් ක්‍රියා කළ ආකාරය සඳහන් කරන්න.

A. කුරුඳු වගාව ..................................................

B. කුරුඳු එක්රැස් කිරීම හා වෙළෙඳාම ..................................................

C. කුරුඳු තැලීම ..................................................

D. ඉඩම් වලින් බදු අය කිරීම .................................................. (ල. 04)

04. i. පහත සඳහන් වන්නේ ලන්දේසි පාලන කාලය තුළ සිංහල භාෂාවට එකතු වූ වචන කීපයකි. ඒවා එකතු වූයේ කුමන ක්ෂේත්‍ර හා සම්බන්ධයෙන් දැයි ලියා දක්වන්න.

| වචන | ක්ෂේත්‍රය |
|---|---|
| A. තරප්පු | .................................................................. |
| B. තෝල්ක | .................................................................. |
| C. වෙන්දේසි | .................................................................. |

(ල. 03)

ii. පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් ලන්දේසීන් සිදු කළ කාර්යයන් එක බැගින් ලියන්න.

A. ඉස්කෝල ආරම්භ කිරීම

B. විෂය මාලාව

C. පාසල් පරීක්ෂාව

D. උසස් අධ්‍යාපනය (ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

iii. ලන්දේසීන් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීමට ගත් පියවර 02 ක් නම් කර විස්තර කරන්න. (ල. 04)

05. i. ඉංග්‍රීසීන්ට ත්‍රිකුණාමලය වරාය වැදගත් වීමට හේතු වූ කරුණු 03 ක් නම් කරන්න. (ල. 03)

ii. පහත සඳහන් වන්නේ උඩරටට දූත ගමන්වල යෙදුන ඉංග්‍රීසි ජාතිකයන් දෙදෙනෙකි.
ඔවුන් මුණගැසුනු රජවරු කවුරුන්දැයි ඉදිරියෙන් ලියා දක්වන්න

1. ජෝන් ෆයිබස් ..........................................................................
2. හියු බොයිඩ් .......................................................................... (ල. 04)

iii. 1797 දී වෙළෙඳ සමාගම් පාලනයට විරුද්ධව මුහුදුබඩ ප්‍රදේශවල කැරැල්ලට බලපෑ හේතු 02 ක් නම් කර පැහැදිලි කරන්න. (ල. 04)

06. i. ඉංග්‍රීසීන් විසින් 1803 දී උඩරට ආක්‍රමණය කිරීමට බලපෑ හේතු 03 ක් නම් කරන්න.

a.

b.

c. (ල. 03)



ii. a. පින්තූරයේ දැක්වෙන්නේ කිරීට පාලනය යටතේ මෙරට පාලනය කළ ආණ්ඩුකාරවරයෙකි. ඔහු කවු ද? (ල. 01)

b. මොහු උඩරට රාජධානිය සම්බන්ධයෙන් අනුගමනය කලේ කවර ප්‍රතිපත්තියක් ද? (ල. 01)

c. කිරීට පාලනය යටතේ ලංකාව පාලනය කළ තවත් ආණ්ඩුකාරවරු දෙදෙනෙක් නම් කරන්න (ල. 02)

iii. උඩරට සම්බන්ධයෙන් ජෝන් ඩොයිලි අනුගමනය කළ උපායශීලි ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්‍ෂණ 04 ක් නම් කරන්න. (ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. i. 1848 නිදහස් අරගලයට බලපෑ බදු වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

ii. පහත සඳහන් උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

1. 1818 නිදහස් අරගලයේ නායකයෙකු වූ ඇහැලේපොළ අදිකාරම් පිටමන් කළ දිවයින මේ නමින් හැඳින්වේ.
2. 1818 නිදහස් අරගලය පැතිරී ගිය ප්‍රදේශයකි.
3. පුරාණ රාජත්වයේ සංකේතයයි.
4. බ්‍රිතාන්‍යයන් වෙරළ තීරයේ ආරම්භ කළ වෙළෙඳ බෝගයකි.

පහළට

1. ටොරින්ටන් සාමිවරයා පනවන ලද බද්දකි.
2. 1848 සටන මර්දනයට මෙම නීතිය පනවන ලදී.
3. ලාංකික පුනර්ජීවන යුගයේදී විශේෂ අවධානයට යොමු වූ ආගමකි.
4. 1818 කැරැල්ල මර්දනයට මෙම ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | | | 1 මු | | | | 4 බ් | | |
| | | | | | | | | | 2 මා |
| | | | | | | | | | |
| 2 හ | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| 4 | | | 3 ද | | | | | | |

(ල. 08)

****

SLGURU.LK
For Educational Purpose Only

"The only person who is educated is the one who has learned how to learn and change." — Carl Rogers

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

# පළමු වාර පරීක්ෂණය - 2019
## ඉතිහාසය (පිළිතුරු පත්‍රය)
## 9 ශ්‍රේණිය

I - කොටස

01. කලන් අල්බස් 02. වෙල්ලස්ස 03. කැප්පෙටිපොළ 04. පෙඩ්රික් නෝර්ත්
05. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි 06. ✓ 07. ✓ 08. ✓ 09. × 10. × 11. (1) 12. (2) 13. (3)
14. (4) 15. (1) 16. හෙන්රි වෝඩ්
17. තිස්සමහාරාමය වැව ප්‍රතිසංස්කරණය / වාරිමාර්ග පිළිබඳ සෙවීමට කොමිෂන් සභාවක් පත්කිරීම
18. මැකලම් ආණ්ඩුකාරවරයා
19. වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම 20. ආතර් ගෝඩ්න්

II - කොටස

01. i. අ) ලිස්බන් ආ) B ඇ) C ඈ) D (ල. 04)
ii. අ) පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම (ල. 01) ආ) ඕලන්දය / නෙදර්ලන්තය (ල. 01)
ඇ) ආසියාවේ ප්‍රදේශ යටත් කිරීම /බලකොටු ඉදිකිරීම / ආණ්ඩුකාරවරු පත් කිරීම / වෙළෙඳාම කිරීම (ල. 02)
iii. i. 1818 ii. ඇහැලේපොළ /කැප්පෙටිපොළ/මඩුගල්ලේ/බූටැවේ රටේ රාළ
iii. මාතලේ iv. වීරපුරන්අප්පු /ගොංගාලේගොඩ බණ්ඩා (ල. 04)
iv. 1. B 2. A 3. C 4. D (ල. 04)

02. i. A. ජොරිස් වැන් ස්පිල්බර්ජන් B. සීබෝල් ද වාට්
C. ජෙරාඩ් හල්ප්ට් (ල. 03)
ii. A. මන්නාරම B. ත්‍රිකුණාමලය C. ගාල්ල D. කොළඹ (ල. 04)
iii. පෘතුග්‍රීසීන්ගෙන් අල්ලා ගන්නා බලකොටුවල ලන්දේසි හමුදා නතර කළ යුත්තේ රජුගේ කැමැත්ත පරිදිය යන වගන්තිය ලන්දේසි අමතක කර කටයුතු කිරීම.
මීගමුව - ගාල්ල යන කුරුඳු බහුල බලකොටු ලන්දේසින් යටතේ තබා ගැනීම. පැහැදිලි කිරීමට (ල. 04)

03. i. සියම් නිකාය ආරම්භ කිරීම /ජෝන් ෆයිබස්ගේ දූත ගමන/ 1766 ගිවිසුම අත්සන් කිරීම (ල. 03)
ii. 1. ආණ්ඩුකාරවරයා 2. ගාලු කමාන්ඩරිය
3. බෙන්තරගඟේ සිට මඩකලපුව දක්වා ප්‍රදේශ 4. යාපන කමාන්ඩරිය (ල. 04)
iii. A. කුරුඳු වගාව: මුල් කාලයේ ස්වභාවිකව වැවෙන කුරුඳු තැලූ අතර, පසුව කොළඹ, ගාල්ල, කළුතර, අලුත්ගම යන ප්‍රදේශවල කුරුඳු වැවීය
B. කුරුඳු එක්රැස් කිරීම හා වෙළෙඳාම : මහ බද්ද දෙපාර්තමේන්තුව අතරට හා එය කපිතාන්වරයෙකු යටතට පත්කොට කාර්යක්ෂම කිරීම
C. කුරුඳු තැලීම : සාම්ප්‍රදායික රාජකාරි ක්‍රමයට කිරීම / ඔවුන්ගේ නම් ලේඛනගත කිරීම
D. බදු අය කිරීම : ඉඩම්වල බදු අයකිරීමට කොමිෂන් සභා පත් කර බදු අය කිරීම

04. i. A. ගෘහ නිර්මාණ B. නීති ක්ෂේත්‍ර හා උසාවි C. වෙනත්
ii. A. ගම් කීපයක් සඳහා පාසලක් ආරම්භ කිරීම හා දරුවන් පැමිණීම අනිවාර්ය කිරීම
B. රෙපරමාදු ආගමේ යාඥාවලට වැඩි අවධානය යොමු කිරීම /ස්වභාෂාව / සංගීතය /දේව ධර්මය ඉගැනීම
C. පරීක්ෂකවරු පත්කිරීම D. කොළඹ සෙමනේරි ආරම්භ කිරීම
iii. ඕලන්දයෙන් දේවගැතිවරු ගෙන්වීම, දේවස්ථාන ඉදිකිරීම (කොළඹ, ගාල්ල, මානම්කාඩු, අච්චුවේලි)

05. i. බෙංගාල බොක්කට හා අග්නිදිග ආසියාවට මුහුණලා පිහිටීම
රට තුළට නෙරා ඇති බැවින් අනතුරු ගත සුළිසුළං වලින් ආරක්ෂාකාරීව නැව නතර කරගත හැකිවීම
ප්‍රංශ ජාතිකයන් සමඟ ගෙන ගිය සටනේ දී යුධමය අතින් වැදගත් වීම
ii. ජෝන් ෆයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු හියුබොයිඩ් - රාජාධිරාජසිංහ රජු
iii. බදු අය කිරීම / බදු එකතු කිරීමට අවුමිල්ෂර්වරුන් පත්කිරීම / භාණ්ඩ වලින් මුදලින් බදු ගෙවීමට සිදුවීම විස්තර කිරීමට (ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

06. i. ත්‍රිකුණාමලය හා කොළඹ අතර ගොඩබිම් සම්බන්ධතා පැවැතවීම දුෂ්කර වීම
ඉංග්‍රීසි පාලන ප්‍රදේශවල ජනතාව උඩරට රජුට
පහතරට ඉංග්‍රීසි විරෝධී කැරළි වලදී රජු උදව් කිරීම ආදි කරුණු 03 ක් දැක්වීමට (ල. 03)

ii. a. තෝමස් මේට්ලන්ඩ් c. සර් ෆ්‍රෙඩ්රික් නොර්ත්, රොබට් බ්‍රවුන්රික් (ල. 01)

b. උපාශිලී ප්‍රතිපත්තියකි (ල. 01)

iii. පහත රැටියන් සමඟ සබඳතා පැවැත් වූ උඩරට නායකයින් අතුරුදහන් කිරීම.
ප්‍රධාන පෙලේ රදලවරුන් සමඟ සම්බන්ධතා පැවැත්වීම.
විවිධ වෙස්ගත් ඔත්තුකරුවන් යෙදවීම.
උඩරට සිරිත්විරිත් ඉගෙන ගැනීම. (ල. 04)

07. i. මුද්දර බද්ද, බලු බද්ද, ඔරු බද්ද, තුවක්කු බද්ද, වෙළෙඳසැල් බද්ද (ල. 03)

හරහට: 1. මුරුසි 2. හත්කෝරළය 3. දළදා වහන්සේ 4. පොල්

පහළට: 1. මුද්දර බද්ද 2. මාෂල්ලෝ 3. බුදු දහම 4. බිම්පාළු (ල. 08)

SLGURU.LK
For Educational Purpose Only